පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

සතිය- 6 සතිය

10 ශ්‍රේණිය

Prepared by- දෙහිඕවිට අධ්‍යාපන කලාපය

<u>නිපුණතාවය මූලික පොත්වල ගණුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.</u>

නිපුණතා මට්ටම - පොදු ජර්නලය පිළියෙල කරයි. (පෙළ පොතේ පිටු අංක 142 - 146 දක්වා හොඳින් කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.)

01) විශේෂ ජර්නල් සඳහා නිදසුන් 2ක් ලියන්න.
02) පොදු ජර්නලය යන්න හඳුන්වන්න.
03) පොදු ජර්නලයේ සටහන් කරන ගණුදෙනු සඳහා නිදසුන් 2ක් ලියන්න.
04) පොදු ජර්නලයක ගණුදෙනු සටහන් කිරීමේදී යොදා ගන්නා මූලාශ්‍ර ලේඛනය නම් කරන්න.
05) පොදු ජර්නලයේ ආකෘතිය ඇඳ දක්වන්න.
06) පොදු ජර්නලයක ආකෘතියේ එක් එක් තීරුවල සටහන් කරන දේ වෙන වෙනම ලියන්න.
07) සංලක්ෂය ලෙස හඳුන්වන්නේ කුමක්ද ?
08) පහත සඳහන් ගණුදෙනු පොදු ජර්නලයක ඇතුලත් කර ලෙජරයට පිටපත් කරන්න.
    a. 2020-05-12 දින ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 100 000 ක් වටිනා ලී බඩු උපකරණ සීමාසහිත නිව් ලංකා සමාගමෙන් ණයට ගැනීම.
    b. 2020-09-20 දින ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 800 000 ක් වටිනා මෝටර් රථයක් සීමාසහිත රංගන සමාගමෙන් ණයට ගැනීම.
09) තාක්ෂණය භාවිතා කරමින් සිදු කෙරෙන ව්‍යාපාර කටයුතු සඳහා නිදසුන් 3ක් ඉදිරිපත් කරන්න.
10) ජංගම දුරකථන භාවිතා කිරීම ව්‍යාපාර කටයුතු සඳහා පහසුවක් වන්නේ කෙසේද ?
11) ටෙලි බැංකු සේවා තුළින් ව්‍යාපාරිකයෙකුට ඉටු කර ගත හැකි කාර්යයන් 3ක් නම් කරන්න.
12) ජංගම දුරකථන බැංකුකරණයේ වාසි 3ක් නම් කරන්න.
13) පරිගණක ආශ්‍රිත ගිණුම්කරණය මගින් සිදු වන්නේ කුමක්ද ?
14) ව්‍යාපාරයක මූල්‍ය වාර්තා පරිගණකය මගින් ස්වයංක්‍රීයව පිළියෙල කිරීමේදී භාවිතා කරන ගිණුම්කරණ මෘදුකාංග පැකේජ් 2ක් නම් කරන්න.
15) පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ වාසි හා අවාසි 2 බැගින් ලියන්න.
16) පෙළපොතේ පිටු අංක 146 හි සඳහන් ක්‍රියාකාරකම් 04 ට පිළිතුරු සපයන්න.